## 3.8 ඔත්තේ සංඛ්‍යා සහ ඉරට්ට සංඛ්‍යා නිරූපණය හා භාවිතය

(අ) උපකරණය සහ එහි උපාංග




(ආ) උපකරණ නිමවුමට කාර්යය පත්‍රිකාව

i. A හි පරිදි වූ සමාන ප්‍රමාණයේ කාඩ්පත් දෙකක් සුදානම් කර ගන්න.
එම එක් එක් කාඩ්පතෙහි උඩු පැත්තේ පෙනුමම යටිපැත්තේ ද සකසා ගන්න.

ii. ඉහත කාඩ්පතට සෑහෙන ප්‍රමාණ එහෙත් දිගින් මදක් අඩු
අ) විනිවිද පෙනෙන කවර දෙකකින්ද
ආ) අර්ධ ලෙස විනිවිද පෙනෙන කොළවලින් සැකසූ කවර එකක්ද සකසා ගන්න.
ඉ) විනිවිද නොපෙනෙන එක් කවරයක එක් කෙළවරකින් ◘ ප්‍රමාණ කෙටසක් කපා ඉවත් කර ගන්න.
(උඩු පැත්තේ හෝ යටි පැත්තේ) (  ලෙස)

iii. අ) විනිවිද නොපෙනෙන එක් එක් කවරයට එක් එක් කාඩ් පත ඇතුළු කර අදාළ උපකරණ යුගලය සකසා ගන්න.
ආ) අවශ්‍ය විටක ඉහත යුගලයෙන් එකක් කවරයට පිටතින් අර්ධ විනිවිද කවරය තුළට ඇතුළු කර ගත හැකි වන සේ සුදානම්ව තබා ගන්න.



(ඇ) උපකරණ භාවිතයට කාර්යය පත්‍රිකාව

i. එක් එක් කවරය තුළට කාඩ් පත බැගින් ඇතුළු කරන්න.

ii. එම කට්ටල් දෙකෙන් එක් කට්ටලයක් ගෙන එහි ,
අ) කවරය එක් පසෙකින් කාඩ්පත විවිධ ප්‍රමාණවලින් (ගණක) මතු කරමින් ඔත්තේ සංඛ්‍යා ද
ආ) කවරයේ අනෙක් පසින් විවිධ ප්‍රමාණවලින් මතු කරමින් ඉරට්ට සංඛ්‍යා ද නිරූපණය / හැඳිනීම සඳහා යොදා ගන්න.

iii. අ) කට්ටල් දෙකෙන් එක එකෙහි වෙන වෙනම ඔත්තේ සංඛ්‍යාව බැගින් නිරූපණය කර ඒවා එකතු කර බලන්න.



ඔ + ඔ = ☐ නිගමනය කරන්න.

ආ) iii හි කට්ටල් දෙකෙහි ඉරට්ටේ සංඛ්‍යාව බැගින් මතු කර එකතු කර බලන්න.



ලෙස ඉ+ඉ = ☐

ඇ) පෙර ලෙස ඔ + ඉ = ☐

මෙන්ම ඉ + ඔ = ☐

ඈ). ඉහත පරිදිම අඩු කිරීම සඳහා අමතර විනිවිදක කවරය ද භාවිතා කරමින් ඔ-ඔ = ☐

ඔ - ඉ = ☐ , ඉ - ඔ = ☐ , ඉ - ඉ = ☐ වැනි අවස්ථා ද නිරීක්ෂණය කරන්න.